කාලය මිනිත්තු 20 යි.

නිපුණතාව 9.0 - ආයතනයක ගිණුම් වාර්තා අසම්පූර්ණ වූ විටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

නිපුණතා මට්ටම 9.1 - අසම්පූර්ණ සටහන් පැහැදිලි කර එයට හේතු ඉදිරිපත් කරයි.

**<u>අභ්‍යාස 01</u>**

කසුන්ගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු ඔබට සපයයි.

| | 2019.01.01 දිනට (රු.) | 2019.12.31 දිනට (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | 650 000 |
| මෝටර් රථ | 400 000 | 350 000 |
| බඩු තොගය | 80 000 | 60 000 |
| ණය ගැතියෝ | 100 000 | 120 000 |
| සුළු මුදල් ශේෂය | 50 000 | 80 000 |
| ණය හිමියෝ | 25 000 | 30 000 |
| බැංකු අයිරාව | 5 000 | 15 000 |

වර්ෂය තුළදී කසුන් විසින් රු. 12 000 ක් සිය පුද්ගලික වියදමට ලබාගෙන ඇති අතර ඔහු විසින් 2019.06.20 දින රු. 100 000 ක අමතර ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යොදවා ඇත.

අවශ්‍ය වන්නේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කසුන්ගේ ව්‍යාපාරයේ ලාභය/අලාභය ගණනය කිරීම